# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 45 දරන
# පොල් සංවර්ධන (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 නොවැම්බර් මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1984 නොවැම්බර් මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි

තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1984 අංක 45 දරන පොල් සංවර්ධන (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1984 නොවැම්බර් මස 28 වන දින.]

එල්. ඩී.—ඕ. 53/82.

**පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා ඇති කරන ලද ඇතැම් අරමුදල් සඳහා එකතු කොට ඒ අරමුදල්වලට බැර කරන ලද්දාවූද මුදල් ගෙවීම නියම කිරීම සහ ගෙවීම වලංගු කිරීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.**

1. (1) මේ පනත 1984 අංක 45 දරන පොල් සංවර්ධන (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තිය සහ 2 වන වගන්තිය හැර, මේ පනතේ විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින්මතු මේ පනතේ "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක ක්‍රියාත්මක විය යුතු ය.

මේ වගන්තිය සහ 2 වන වගන්තිය මේ පනත ආරම්භ වන දිනයේ දී ක්‍රියාත්මක විය යුතු ය.

**මුදල් ගෙවීම නියම කිරීම සහ ගෙවීම වලංගු කිරීම.**

2. ((i) 1976 සැප්තැම්බර් මස 13 වන දින සහ 1977 නොවැම්බර් මස 15 වන දින අතර, වියලි පොල් නැව්ගත කරන්නන් මත නියම කරනු ලැබ පොල් සංවර්ධන අධිකාරිය විසින් පවත්වා ගෙන යනු ලබන පොල් සංවර්ධන අරමුදලට ගෙවනු ලැබූ සියලු සෙස් බදු ද;

(ii) 1978 අප්‍රේල් මස 26 වන දින සහ 1978 ජූලි මස 31 වන දින අතර පොල් නිෂ්පාදන නැව්ගත කරන්නන් මත නියම කරනු ලැබ පොල් සංවර්ධන අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන වියලි පොල් අලෙවි සංවර්ධන අරමුදලට ගෙවනු ලැබූ සියලු සෙස් බදු ද;

(iii) 1978 අගෝස්තු මස 1 වන දින සහ 1981 නොවැම්බර් මස 12 වන දින අතර වියලි පොල් මෝල් හිමියන් මත නියම කරනු ලැබ පොල් සංවර්ධන අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන කර්මාන්ත සංවර්ධන අරමුදලට ගෙවනු ලැබූ සියලු සෙස් බදු ද,

වලංගු ලෙස නියම කරනු ලැබ ගෙවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**160 වන අධිකාරය සංශෝධනය කිරීම.**

3. (1) පොල් නිෂ්පාදන ආඥාපනතේ 22 වන වගන්තිය සහ 23 වන වගන්තිය ඉවත් කිරීමෙන්, ඒ ආඥාපනත මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(2) පොල් නිෂ්පාදන ආඥාපනතේ 23 වන වගන්තිය යටතේ අයකර ගනු ලැබ, 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද පොල් අලෙවි මණ්ඩලයට සහ පොල් සැකසුම් මණ්ඩලයට ගෙවන ලද සියලු සෙස් බදු වලංගු ලෙස ගෙවනු ලැබූ සේ සලකනු ලැබිය යුතු ය.

ජ 079701—6,825 (84/10)

440 වන අධිකාරය සංශෝධනය කිරීම.

4. (1) පොල් පර්යේෂණ ආඥාපනත පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එහි 6 වන වගන්තිය ඉවත් කිරීමෙන්; සහ

(ආ) එහි දෙවන උපලේඛනය අත් හැරීමෙන්.

(2) පොල් පර්යේෂණ ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ අයකර ගනු ලැබ, 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද පොල් පර්යේෂණ මණ්ඩලයට ගෙවන ලද සියලුම සෙස් බදු වලංගු ලෙස ගෙවනු ලැබූ සේ සලකනු ලැබිය යුතු ය.

1967 අංක 17 දරන පනත සංශෝධනය කිරීම.

5. (1) 1967 අංක 17 දරන පොල් කෙඳි පනතේ 18 වන වගන්තිය ඉවත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(2) පොල් කෙඳි පනතේ 18 වන වගන්තිය යටතේ අයකර ගනු ලැබ, 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද පොල් අලෙවි මණ්ඩලයට සහ පොල් සැකසුම් මණ්ඩලයට ගෙවන ලද සියලු සෙස් බදු වලංගු ලෙස ගෙවනු ලැබූ සේ සලකනු ලැබිය යුතු ය.

පොල් සැකසුම් මණ්ඩලය සහ පොල් අලෙවි මණ්ඩලය විසින් එකතු කරන ලද මුදල් වලංගු කිරීම.

6. 1972 මැයි මස 5 වන දින සිට 1972 දෙසැම්බර් මස 31 වන දින දක්වා පොල් අලෙවි මණ්ඩලය සහ පොල් සැකසුම් මණ්ඩලය විසින් එකතු කරන ලද සියලු සෙස් බදු, වලංගු ලෙස එකතු කරන ලද සේ සලකනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

7. මේ පනතේ කාර්ය සඳහා—

"පොල් අලෙවි මණ්ඩලය" යන්නෙන්, 1972 මාර්තු මස 30 වන දින අංක 15,004 දරන ගැසට් පත්‍රයෙහි පළකරන ලද නියමය මගින් ඇති කරන ලද්දා වූ සහ 1979 දෙසැම්බර් මස 31 වන දින අංක 69/3 දරන අති විශෙෂ ගැසට් පත්‍රය යටතේ විසුරුවා හරින ලද්දා වූ ද මණ්ඩලය අදහස් වේ;

"පොල් සැකසුම් මණ්ඩලය" යන්නෙන්, 1972 අප්‍රේල් මස 7 වන දින අංක 15,005 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමය මගින් ඇති කරන ලද්දා වූ සහ 1979 දෙසැම්බර් මස 31 වන දින අංක 69/3 දරන අති විශෙෂ ගැසට් පත්‍රය යටතේ විසුරුවා හරින ලද්දා වූ ද මණ්ඩලය අදහස් වේ;

"පොල් පර්යේෂණ මණ්ඩලය" යන්නෙන්, 1972 මාර්තු මස 30 වන දින අංක 15,004 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද්දා වූ නියමය මගින් පිහිටුවන ලද මණ්ඩලය අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.